**සිංහල පරිවර්තනය**

**උ.ප.රා.සේ.කො.ස.චක්‍රලේඛ අංක 02/2022**

මගේ අංකය NP/07/10/02/186
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය.
10.01.2022

ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාරවර ලේකම්,
අමාත්‍යාංශ ලේකම්වරුන් ,
නියෝජ්‍ය ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
උතුරු පළාත.

**උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවාIII, II හා I ශ්‍රේණියේ රියදුරන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය-2016 (II) 2022**

**2013.01.01**දින සිට ක්‍රියාත්මක වන පරිදි උතරු පළාත් ගරු ආණ්ඩුකාරවරිය විසින් අනුමත කරන ලද හා කලින් කල සිදු කරන ලද සංශෝධනයන්ට යටත්ව උතුරුපළාත් රාජ්‍ය සේවය තුළ මෝටර් රථරියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ සේවා ව්‍යවස්ථාවේ 9වන ඡේදය හා 14වන ඡේදයෙ හි සඳහන් විධිවිධාන, අතුරු කාලීන විධිවිධාන හා ඇමුණුම් 02, 03 හා 04හි සඳහන් විධිවිධානයන්ට ද අනුකූලව පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවය III, II හා Iවන ශ්‍රේණියේ රියදුරන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය, උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් **2022 වර්ෂයේ** පැවැත්වීමට නියමිත බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මෙම විභාගය පහත සඳහන් නගර වල පැවැත්වීමට නියමිත වන අතර එම නගර වලට අදාළ නගර අංක පහතසඳහන් කර ඇත,මෙහිදී ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක හෝ වෙනත් හේතූන් මත විභාග මධ්‍යස්ථානය සම්බන්ධ වෙනසක් කිරීමට සිදුවුවහොත් ඒ සම්බන්ධයෙන් තිරණ ගැනිමේ බලයරාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමා සතු වේ. අයදුම් කරන විට අයදුම්පත්‍රයේ සඳහන් නගරය පසුව වෙනස් කිරීමට අවස්ථාවක් නොලැබේ.

| නගරය | නගර අංකය |
|---|---|
| යාපනය | 01 |
| වවුනියාව | 03 |

3.0 **සුදුසුකම්:-**තනතුරට ආදාළසේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි එම සේවයට අදාළ ශ්‍රේණියේ පත්වීමක්/උසස් වීමක් ලබා ඇති රියදුරන් හා මෙම විභාගයට පෙනී සිට මේ දක්වා සමත් නොවූ රියදුරන් ද මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

4.0 ඉල්ලුම්පත්‍රය මෙම චක්‍රලේඛය සමඟ අමුණා ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල විය යුතුය. එම ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූලව අපේක්ෂකයින් විසින් තම ඉල්ලුම්පත්‍රය සකස් කර, එම ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2022.01.25** වන දිනට හෝ රට ප්‍රථම **ලේකම්, පළාත් රාජය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය යොමු කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍රය භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර හා අවශ්‍ය තොරතුරු සපයා නොමැති ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.0 **අපේක්ෂකයින්ගේ අනන්‍යතාව:-** අපේක්ෂකයන් තමන් පෙනී සිටින සෑම විෂයයකටම විභාග අධීක්ෂණ නිලධාරියා තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් කුමක් හෝ ලේඛනයක් එම නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය (Passport)

(iii) වලංගු රියදුරු බලපත්‍රය (Driving License)

ඉහත සඳහන් ලේඛන වලින් කුමක් හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපහොසත් වන අයදුම්කරුවකුගේ අනන්‍යතාව අවලංගු කිරීමේ බලය විභාග ශාලාධිපති සතුය.

6.0 **අයදුම්පත්:-** අංක 1 සිට 5 දක්වා ඡේදයන් පළමුවන පිටුවටද අනෙක් කරුණු දෙවන පිටුවේද ඇතුළත් වන පරිදි 'ඒ 4' ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය සකස් කළ යුතුය. එම අයදුම්පත්‍රය පරිගණක යතුරු ලියනය මගින් සකස් කර නිවැරදිව හා පැහැදිලිව තම අත් අකුරුවලින් සම්පූර්ණ කර යොමු කළ යුතුයි. අයදුම්පත සකස් කිරීමේ දී මේ සමඟ අමුණා ඇති ආකෘතිය පරිදි ම සකස් කර ගත යුතු අතර, සකස් කරන ලද අයදුම්පත්‍රයේ ඡායාපිටපතක් හෝ වෙනත් පිටපත් භාර ගනු නොලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට නොගැළපෙන හා අසම්පූර්ණ තොරතුරු සපයන ලද අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද විභාග කොන්දේසි වල සඳහන් වූ පරිදි හා ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාර තම අයදුම්පත සකස් කර ගැනීම සම්බන්ධයෙන් අපේක්ෂකයා තම අවධානය යොමු කළයුතු අතර එහි පිටපතක් තමන් ළග තබා ගැනිම ප්‍රයෝජනවත් විය හැකිය.

**7.0 විභාග ගාස්තුව :**

7.1 පළමුවරට මෙම විභාගයට පෙනී සිටින රියදුරන් විභාග ගාස්තුව කිසිවක් ගෙවීමට අවශ්‍ය නොවේ. එසේ වුවද ඉන්පසු වාරවල දි මෙමවිභාගයට පෙනි සිටිනවා නම් රු 250.00 වටිනා මුදල් ඇණවුමක් උතුරු පළාතේ ඇති ඕනෑම තැපැල් කාර්යාලයකින්, **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් ගේ නමට ලබාගත යුතු අතර එය යාපනය, මහ තැපැල් කාර්යාලයෙන් මාරු කළ හැකි පරිදි** ලබාගත් මුදල් ඇණවුම අයදුම්පත්‍රයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එම මුදල් ඇණවුමෙ ඡායා පිටපතක් තමන් ලග තබා ගැනිම ප්‍රයෝජනවත් විය හැකිය.

7.2 මොනම හේතුවක් නිසාවත් මෙම ගාස්තු නැවත නොගෙවනු ලබන අතර එම ගාස්තුව වෙනත් විභාගයක් සඳහා යොදාගත නොහැකි බවත් දන්වා සිටිමි.

8.0 අයදුම්පත් ඉදිරිපත් කර ඇති රියදුරන්ට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් යථා කාලයේදී ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලබයි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම යනු එම අපේකෂකයා විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සියල්ල සපුරා ඇති බවට සනාථ කිරීමක් නොවන බව සැලකිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් විභාග ශාලාවේ අධීක්ෂණ නිලධාරියා වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාගයට පෙනී සිටීමට අවස්ථාව දෙනු නොලැබේ. යම් අපේක්ෂකයකුට අවම වශයෙන් විභාගයට දින 03කට ප්‍රථම ප්‍රවේශපත්‍ර ලැබුණේ නැතිනම් ඒ පිළිබඳව පහත සඳහන් තොරතුරු සමඟ **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ට** දැන්විය යුතුය.

(i) ආවරණ ලිපියක්

(ii) ඉල්ලුම්පතේ පිටපතක්

(iii) මුදල් ඇණවුමේ සහතික කල පිටපතක්

(iv) ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු ෆැක්ස් අංකය (Fax No)

(v) අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය හා දිනය

9.0 මෙම විභාගය සඳහා පෙනී සිටින රියදුරන්ට විභාගයට පෙනී සිටීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් ආයතන සංග්‍රහයේ ඡේදය XII 19වන වගන්තියේ විධිවිධානයන් පරිදි විසින් රාජකාරි නිවාඩු අනුමත කිරීමට පියවර ගත යුතුයි.

10.0 මෙම විභාගයට පෙනි සිටින අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

11.0 **විභාග පරිපාටින් :**

11.1 උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ III වැනි ශ්‍රේණියේ රියදුරන්ගේ පළමු වෙනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය.

1.විෂය නිර්දේශය:-

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| නිපුණතාවයන් පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 1. මහාමාර්ග හා මාර්ග නීති සම්බන්ධ ප්‍රායෝගික දැනුම<br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම |
| වාචික පරීක්ෂණය - පහත සඳහන් කරුණු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ.<br>1. ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම<br><br>2. රජයේ වාහන පරිහරණය හා නඩත්තු කිරීම පිළිබඳ දැනුම | පරිවාස කාලය, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ,අතිකාල දීමනා, නිවාඩු, දුම්රිය බලපත්‍ර, සන්නිවේදන මාර්ග, සාමාන්‍ය හැසිරීම හා විනය<br><br>*මෝටර් රථ රියදුරන්ගේ රාජකාරී සහ වගකීම<br>*රජයේ වාහන නඩත්තුව හා ආරක්ෂාව සම්බන්ධ රියදුරුගේ වගකීම<br>* දෛනික ධාවන සටහන<br>* වාහන ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම<br>* වාහන අළුත්වැඩියාව හා සේවා කටයුතු<br>*රජයේ වාහන වලට සිදුවන අනතුරු හා අනතුරු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග |

2.ලකුණු ලබා දීමේ ක්‍රමය:

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 50 | 20 |
| වාචික පරීක්ෂණය | 50 | 20 |
| මුළු ලකුණු ප්‍රමාණය | 100 | 40 |

❖ වාචික හා ප්‍රායෝගික විභාග දෙකම එකවරකදී සමත්විය යුතුයි

11.2 උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ IIවැනි ශ්‍රේණියට අයත් රියදුරන් සඳහා දෙවෙනි (02) කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පහත සඳහන් විෂයයන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක 'යටතේ පරීක්ෂා කරනු ලැබේ.

1. විෂය නිර්දේශය:-

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය<br>1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br><br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෙම ක්ෂේත්‍රය තුළ ගතවූ සේවා කාලය තුළ සිදුවී ඇති පටිපාටිමය, නීතිමය වෙනස්කම් හා රියදුරුගේ ශිල්පීය ප්‍රවීණතාවය එම රියදුරාගේ ජ්‍යෙෂ්ඨත්වයට ගැලපෙන පරිදි වර්ධනය වී තිබේ ද යන්න මැන බැලීම. |

2.ලකුණු ප්‍රදානය කිරීමේ ක්‍රමය:-

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය<br>1.මහාමාර්ග නීති පිළිබඳප්‍රායෝගික දැනුම<br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50<br>50 | 20<br>20 |
| මුළු ලකුණු ප්‍රමාණය | 100 | 40 |

❖ ප්‍රවීනාතාවයන් දෙකම එකවර සමත්විය යුතුයි

11.3 උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ I වැනි ශ්‍රේණියේ රියදුරන්ගේ 3වැනි කාර්යක්ෂමතා කඩඉම්විභාගයට පහත සඳහන්කරුණු සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් යටතේපරීක්ෂා කරනු ලැබේ.

1. **විෂය නිර්දේශය:-**

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1.මහාමාර්ග නීති පිළිබද ප්‍රායෝගික දැනුම<br><br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මහාමාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව දැනුමට අමතරව රියදුරු තැනගේ ශිල්පීය ප්‍රවීණතාවය එම නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වයට ගැළපෙන පරිදිමනා ලෙස වර්ධනය වී තිබේද යන්න හා නිලධාරියා සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා තිබේද යන්න මැන බැලීම සිදු කෙරේ. |

**2.ලකුණු ප්‍රදානය කිරීමේ ක්‍රමය**

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය<br>1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | <br>50<br>50 | <br>20<br>20 |
| එකතුව | 100 | 40 |

❖ **ප්‍රවීනතාවයන් දෙකම එකවර සමත් විය යුතුයි.**

12.0 මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු ඔබේ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාලවල සේවය කරන අදාළ නිලධාරින්ට දනුම් දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. එමෙන්ම මෙම තොරතුරු උතුරු පළාත් සභාවෙ www.np.gov.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

13. **සටහන**:- මෙම විභාග දැන්වීමට විධිවිධානය කර නැති යම්කරුණක් සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවයන් අතර වෙනසක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

***සි. තිරුවාකරන්***
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත.